(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක **17.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2023 අප්‍රේල් 25 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **මනූෂ නානායක්කාර මහතා,** කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා සහ වාරිමාර්ග අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩයනා ගමගේ මහත්මිය,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **නීතිඥ තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **තවරාජා කලෛයි අරසන් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **එම්. උදයකුමාර් මහතා**

ගරු **(ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු **අකිල එල්ලාවල මහතා**

ගරු **ලලිත් එල්ලාවල මහතා**

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු  මංජුලා දිසානායක මහත්මිය

ගරු  විමලවීර දිසානායක මහතා

ගරු  සාරතී දූෂ්මන්ත මහතා

ගරු  (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු  ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු  නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු  ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු  (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු  අසංක නවරත්න මහතා

ගරු  වාසුදේව නානායක්කාර මහතා

ගරු  චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු  කිංස් නෙල්සන් මහතා

ගරු  බුද්ධික පතිරණ මහතා

ගරු  නිමල් පියතිස්ස මහතා

ගරු  (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු  ඩිලාන් පෙරේරා මහතා

ගරු  නිරෝෂන් පෙරේරා මහතා

ගරු  කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු  ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු  ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු  මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු  උද්දික ප්‍රේමරත්න මහතා

ගරු  රෝහණ බංඩාර මහතා

ගරු  ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු  (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු  රිසාඩ් බදියුදීන් මහතා

ගරු  සුදත් මංජුල මහතා

ගරු  එස්. එම්. මරික්කාර් මහතා

ගරු  ඉම්රාන් මහරූෆ් මහතා

ගරු  ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු  අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු ජගත් සමරවික්‍රම මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු අබ්දුල් හලීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු ජයරත්න හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, වැඩබලන පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1.ජනාධිපතිවරයාගෙන් ලැබෙන සංදේශ:** ජනාධිපතිවරයාගෙන් ලද මතු පළවන සංදේශය නියෝජ්‍ය කථානායකවරයා විසින් කියවන ලදී:—

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/4/5/1

2023 අප්‍රේල් මස 21 වන දින

**ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

රනිල් වික්‍රමසිංහ
ජනාධිපති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

**2. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** නියෝජ්‍ය කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදන කරන ලදී:—

I

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, 'දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)' නමැති පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් ගරු කථානායකතුමා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි."

II

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ශෙහාන් සේමසිංහ මහතා විසින් 2023 මාර්තු 10 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය."

III

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හේෂා විතානගේ මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩු සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2023 අප්‍රේල් 04 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වීරසුමන වීරසිංහ මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

IV

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ තලතා අතුකෝරල මහත්මිය පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2023 අප්‍රේල් 04 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

V

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හරීන් ප්‍රනාන්දු මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජීවන් තොන්ඩමන් මහතා ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩු සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2023 අප්‍රේල් 04 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කනක හේරත් මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. රාමේෂ්වරන් මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

VI

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2023 අප්‍රේල් 04 දින

තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුරාධ ජයරත්න මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.”

VII

“පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. උදයකුමාර් මහතා ආගමික කටයුතු හා සහජීවනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2023 අප්‍රේල් 04 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වේලු කුමාර් මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.”

VIII

“පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජීවන් තොන්ඩමන් මහතා ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2023 අප්‍රේල් 04 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. රාමේෂ්වරන් මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.”

IX

“පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2023 අප්‍රේල් 04 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මයන්ත දිසානායක මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.”

X

“පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මයන්ත දිසානායක මහතා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2023 අප්‍රේල් 04 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.”

XI

“පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මොහමඩ් මුසම්මිල් මහතා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2023 අප්‍රේල් 04 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වීරසුමන වීරසිංහ මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.”

XII

“පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2023 අප්‍රේල් 04 දින

තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හේෂා විතානගේ මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.”

XIII

“පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විදුර වික්‍රමනායක මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නලින් ප්‍රනාන්දු මහතා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩු සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2023 අප්‍රේල් 04 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.”

**3. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) නියෝජ්‍ය කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව —

(i) 2012 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXVI කොටස;

(ii) 2013 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XII කොටස;

(iii) 2014 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXX කොටස;

(iv) 2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XVII කොටස;

(v) 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XXX කොටස;

(vi) 2018 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLVI කොටස සහ තෙවැනි කාණ්ඩයේ XIX කොටස;

(vii) 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLV, XLVI, XLVII හා XLVIII කොටස්, තෙවැනි කාණ්ඩයේ XVIII, XIX හා XX කොටස් සහ නවවැනි කාණ්ඩයේ XXXVI, XXXVII හා XXXVIII කොටස්;

(viii) 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLIII, XLIV, XLV, XLVI හා XLVII කොටස්, තෙවැනි කාණ්ඩයේ XX, XXI හා XXII කොටස් සහ නවවැනි කාණ්ඩයේ XXXIV, XXXV හා XXXVI කොටස්; සහ

(ix) 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXIX, XXX, XXXI, XXXII, XXXIII හා XXXIV කොටස්, තෙවැනි කාණ්ඩයේ XV හා XVI කොටස් සහ නවවැනි කාණ්ඩයේ XXII, XXIII, XXIV හා XXV කොටස්

ඉදිරිපත් කර එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 2019 සහ 2020 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා, ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 24 දිනැති අංක 2324/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි;

(ii) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බද්ද සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 28 දිනැති අංක 2325/06 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(iii) 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 අප්‍රේල් 03 දිනැති අංක 2326/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය

පිළිගන්වා එම රෙගුලාසි, නියමය සහ නියෝගය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2023 අප්‍රේල් 17 දිනැති අංක 2328/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරමින් කරන ලද ප්‍රකාශනය ඉදිරිපත් කරන ලදී.

එම ලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(5) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් —

(i) 2020 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2021 වර්ෂය සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා, අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වගන්තිය සමඟ කියවිය යුතු 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පරිගණක පීඨයේ මෘදුකාංග ඉංජිනේරු, දත්ත විද්‍යා සහ ආගනණය සහ තොරතුරු පද්ධති අධ්‍යයන අංශ පිහිටුවීම සහ ව්‍යවහාරික විද්‍යා පීඨයේ ස්වභාවික සම්පත්, භෞතික විද්‍යා සහ තාක්ෂණ, ආහාර විද්‍යාව සහ තාක්ෂණවේදය සහ ක්‍රීඩා විද්‍යා සහ ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශ පිහිටුවීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 දෙසැම්බර් 27 දිනැති අංක 2312/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වන ලදී.

එම ලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(7) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවල වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(9) ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින්—

(i) 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2016, 2017, 2018, 2019 සහ 2020 වර්ෂ සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ වාර්ෂික වාර්තා

ඉදිරිපත් කර එම වාර්තා, මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 2020 වර්ෂය සඳහා උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා, ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(12) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(13) කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව විදෙස් රැකියා සහ ශ්‍රමය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(14) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, සෞඛ්‍ය

පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(15) වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ඉදිරිපත් කර එම වාර්තාව අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(16) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4. **කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2023 ජනවාරි 30 දිනැති අංක 2317/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 2018 වර්ෂය සඳහා පුනරුත්ථාපන අධිකාරියේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය;

(iii) 2019 සහ 2020 වර්ෂ සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලයේ වාර්ෂික වාර්තා සහ ගිණුම් ප්‍රකාශ;

(iv) 2020 සහ 2021 වර්ෂ සඳහා අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වාර්ෂික වාර්තා;

(v) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(vi) 2021 වර්ෂය සඳහා අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(vii) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු නලින් ප්‍රනාන්දු මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2019 වර්ෂය සඳහා අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(ii) 2020/2021 වර්ෂය සඳහා සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2020 වර්ෂය සඳහා අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**5. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) මාතර, හිත්තැටිය මැද, හේවගෙ වත්ත, අංක 106 ඒ දරන ස්ථානයෙහි පදිංචි අනුර විරසිංහ මහතාගෙන් ලැබුණු 2023.02.06 දිනැති පෙත්සම ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) කළුතර, කිතුලාව, මින්නේරිතැන්න, අංක 01, 'රණවිරු නිවස' දරන ස්ථානයෙහි පදිංචි කේ.ජී. සමන් මහතාගෙන් ලැබුණු 2023.03.07 දිනැති පෙත්සම ගරු නීතිඥ මධුර විතානගේ මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

**6. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ:** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා පිළිගැන්වූ පනත් කෙටුම්පත,— අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් දැක්වීම සහ ඒ අයිතිවාසිකම් සහ හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමට සහ ඔවුන් ආරක්ෂා කිරීමට අදාළ සුදුසු ජාත්‍යන්තර ප්‍රතිමාන, ප්‍රමිති සහ යහපත් පරිචයන් බලාත්මක කිරීම පිණිස ද; අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය පිහිටුවීම, අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය පිහිටුවීම සහ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂණ අරමුදල පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; අපරාධයක

වින්දිතයන්ට වන්දි ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත පරිච්ඡින්න කිරීම පිණිස ද; සහ ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2023 මැයි 09 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**7. පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2023 අප්‍රේල් 25 අඟහරුවාදා, 26 බදාදා, 27 බ්‍රහස්පතින්දා සහ 28 සිකුරාදා දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 5.30 දක්වා විය යුතු ය. අ.භා. 5.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. වරප්‍රසාද:** ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා, ගරු ගයන්ත කරුණාතිලක මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කරන ලද යෝජනාව— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2023 අප්‍රේල් 04 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය:** ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා, ගරු මනෝ ගනේෂන් මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඒ අනුව, පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**10. අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය:** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් පනවන ලදුව,

2023 ජනවාරි 30 දිනැති අංක 2317/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.03.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අ.භා. 1.22ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

“ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය යුතු ය”යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.00 ට ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය.)

“ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය යුතු ය”යි දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.19ට ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය.)

“ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය යුතු ය”යි දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.24ට ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය.)

“ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා මූලාසනාරූඪ විය යුතු ය”යි ඉෂාක් රහුමාන් මහතා ස්ථිර කරමින් මුදිතා ප්‍රිශාන්ති මහත්මිය විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.44ට ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. කල් තැබීම (හෝටල් සහ බේකරි සඳහා ප්‍රමිතිගත ක්‍රමවේදයන් හඳුන්වා දීම) :** “මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය”යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

එකල්හි වේලාව අ.භා. 5.30 පසුකර තිබුයෙන් අ. භා. 6.12 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අද දින සභා සම්මතිය අනුව, ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2023 අප්‍රේල් 04 දින සභා සම්මතිය අනුව, 2023 අප්‍රේල් 26 බදාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේය.